

# ගණං ෆේල් ද?

මේ විහිළු සමහර විටෙක එක් අයෙකු විසින් අනෙකෙකු අරඹයා පවසන හුදු සරදම් වදන් විය හැකිය. අනෙක් විටක එක් අයෙකු විසින් අනෙ-කෙකු ඉලක්ක කරගෙන සිනහව උපදවීමට කරන යම් කිසි ප්‍රායෝගික ක්‍රියාවක් විය හැකිය.

ඇස් රතු වෙන විහිළු යැයි හැඳින්වෙන්නේ, අපේක්ෂිත ප්‍රතිඵලය වන මුව පිරුණු සිනහව වෙනුවට, නෙත බර කරන කඳුලින් අවසන් වෙන ආකාරයේ විහිළු වේ.

විහිළුවක්, එය කරන, ලබන දෙපාර්ශවයටම එකසේ රස විඳිය නොහැකි වේ නම්, එය සාර්ථක විහිළුවක් ලෙස සැලකිය නො හැකිය.

ප්‍රායෝගික ක්‍රියාවක් සම්බන්ධ නොවී, හුදෙක් වදන් කිහිපයකින් පමණක් කෙරෙන විහිළුවකින් යම් අයෙකු ගේ සිත් ණිදේ නම් හෝ ඇස් රතු වේ නම්, ඒ එම වදන්වල යම් කිසි කටුක වූ සත්‍යයක් අඩංගු නිසා බව මගේ අත්දැකීමයි.

මේ තිස් දෙවසරකට පෙර මා ලැබූ එවන් අත්දැකීමකි.

මා ආනන්ද විද්‍යාලයේ ඉගෙනුම ඇරඹුයේ, අපේ රටේ දේශපාලන පෙරළි සමග අනිවාර්යයෙන් ම එළැඹෙන මහා අධ්‍යාපන පෙරළියක ඉත්තෙකු වෙමින් නමවන වසරේ පැවති ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත්ව, දහවැන්-න් සිට ඇරඹුණු ජාතික උසස් අධ්‍යාපන සහතික පත්‍ර පාඨමාලාව සඳහා සූදනම් වීමට ය.
මාස කිහිපයකින් ම තවත් දේශපාලන පෙරළියක් රටේ සිදුවුණු හෙයින් ඒ සමගම ආ තවත් එක් අධ්‍යාපන පෙරළියක ඉත්තෙකු වෙමින් හඳුරමින් තිබූ නව පාඨමාලාවේ සිට පැරණි ක්‍රමයේ උසස් පෙල විභාග පාඨමාලාවක් කරා විතැන් වීමට අපට සිදුවිය.

මෙහිදී අප හමුවේ පැන නැගි එක් සුවිශේෂී තීරක මංසන්දියක් වූයේ උසස් පෙල සඳහා හදරන්නේ ගණිතය විෂයයන් ද නැතහොත් ජීව විද්‍යා විෂයයන් ද යන්න තෝරා ගැනීමේ අවස්ථාවයි. වෙනත් වචන වලින් කියන්නේ නම්, "ඔබට අවශ්‍ය ඉංජිනේරුවෙක් වෙන්න ද? නැතිනම් දොස්තරෙක් වෙන්න ද?" යන්න තීරණය කිරීමයි.
ගණිතයට වඩා කැමැත්තෝ ගණිතය තෝරා ගත්හ. ජීව විද්‍යා විෂයය හදරන්නේ නම්, ඒ සමගම අනිවාර්යයෙන් ම උරුම වන පාඩම් කිරීමට අකමැත්තෝ ද ගණිතය තෝරා ගත්හ. මම එකී කුලක දෙකට ම අයිති වූවෙක් වීමි.
මා සමග ගණිතය විෂයයන් හැදෑරීම සඳහා ඉදිරිපත් වූවන් අතර මා මිත්‍ර සමුද්‍ර ද සිටීම මට මහත් අත්වැසිල්ලක් විය. සමුද්‍රත් මාත්, එකම පෙදෙසක වාසය කරන, එකට අපේ ගම් පලාත සහ මරදාන අතර දුම්රියෙන් ගමන් කරන, එකට ජුඩෝ පන්තිවලට සහභාගී වෙන, එකට මරදානේ තෝස කඩවලින් තෝසේ අනුභව කරන හොඳ මිතුරන් වීමු.

මේ වන තුරුත් අප දෙදෙනා ම, මේ වන විට අප සම වයස් සිසුන් අතරින් සීඝ්‍රයෙන් වඳවෙමින් යමින් තිබුණු සත්ව කොට්ඨාශයක් වූ "කොට කලිසම් කාරයෝ" වීම ද අපේ මේ මිත්‍ර දම තවත් වර්ධනය කළ කරුණක් විය.

කොටින් ම, අප ගමන් කළ දුම්රියේ යනෙන, තම සිත ගත් එක්තරා දේවී බාලිකාවියක් ගැන සමුද්‍ර මුලින් ම පවසා සිටියේ ද මට ය.

දිනක් සුපුරුදු දුම්රිය වෙනුවට වෙනත් දුම්රියක ගමන් ගනිද්දී මා නෙත ගැටුණු ආනන්ද බාලිකාවියක් ගැන මා මුලින්ම පවසා සිටියේ ද සමුද්‍ර ට ය.

ආනන්දයේ ඉගෙනුම අරඹා ඉතා කෙටි කලකින් ම අප දෙදෙනා අතර ඉතා හොඳ මිතුරුකමක් ගොඩ නැගී තිබුණි.

එකොලොස් වැනි ශ්‍රේණියේ අපොස උසස් පෙල සිසුන් ලෙස ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය ඉගෙනුම ඇරඹූ අපට මුහුණ පාන්නට සිදුවූ බලවත් ගැටළුවක් වූයේ මේ උසස් පෙල පාඨමාලාව හදරන්නන් ට අනිවාර්යයෙන් තිබේ යැයි සැලකුණු ඒ විෂයයන් දෙක පිළිබඳ අපොස සාමාන්‍ය පෙල මට්ටමේ දැනුම අප සතුව නොතිබීමයි. ඒ වෙනුවට අප ලබා සිටියේ පසු කලෙක විශ්ව විද්‍යාල පාඨමාලාවල දී අපට ඉමහත් පිටුවහලක් වූ න්‍යාස, ජාල, කුලක වැනි විෂයය දැනුම ය.

අප කෙතරම් ගණිතයට ප්‍රිය කළවුන් වුවද, හදරා නොතිබූ සංකල්ප පිළිබඳ ඉහල තලයක සිට ඉගෙනුම ලෙහෙසි පහසු දෙයක් නොවිණි.

මේ අවාසනාවන්ත තත්වයේ එක් ආසන්නතම ප්‍රතිඵලයක් වූයේ මාස කිහිපයකින් පැවති පරීක්ෂණයක දී මට ශුද්ධ ගණිතය සඳහා ලකුණු විසි දෙකක් පමණක් ලැබීමයි. මා මිතුරු සමුද්‍ර ලකුණු විසි හයක් ලබා මට ඉදිරියෙන් සිටියේය. මේ තාවකාලික පසුබැස්මට හේතු හොඳින් දන්නා හෙයින් අමුතුවෙන් කළබළ වීමට මට නම් අවශ්‍යතාවයක් නොතිබුණි. එහෙත් දුකෙන් අඳුරු වූ සිය මුහුණ බිමට හරවාගත් සමුද්‍ර හේවාවසම් විනාඩි ගණනාවක් ම ගත කරමින් ගුරුවරිය ගෙන් අපට ආපසු ලැබුණු ලකුණු කරන ලද උත්තර පත්‍රය හොඳින් අධ්‍යයනය කරණු මම දුටුවෙමි. අවසානයේ නැගී සිටි සමුද්‍ර ගේ මුහුණත ඇඳී තිබුනේ ජයග්‍රාහී සිනාවකි.

"මට එක ලකුණක් අඩුවෙනු යි ටීචර් දීලා තියෙන්නේ" ඔහු කියා සිටියේය. "ටීචර් ට වැරදිලා!"
නමුත් අපේ ගණිතය ගුරුවරිය අතින් වරදක් සිදුවී නොතිබුණි. එනිසා, තමන්ට එවත් එක ලකුණක් හිමිවිය යුතු යැයි නැවත නැවතත් සමුද්‍ර කියා සිටියද එය පිළිගත්තේ ඇය නොවේ.
දිනය අවසානයේ ද මගේ ලකුණු ප්‍රමාණය විසි දෙකක් ලෙස ද, සමුද්‍ර ගේ ලකුණු ප්‍රමාණය විසි හයක් ලෙස ද නොවෙනස් ව පැවතුණි.
තම ලකුණු ප්‍රමාණය, ගුරුවරිය විසින් එකකින් වැඩි නොකිරීම පිළිබඳව සමුද්‍ර සිටියේ කෝපයෙන් පිපි-රෙමිනි.

එදින අප දෙදෙනා පාසලෙන් පිටවූයේ වෙනදට වඩා කලින් ය. අප ගමන් ගත් මරදානෙන් 12:55 ට පිටත්වූ දුම්රිය හුණුපිටිය දුම්රිය පොළට ලඟාවෙත්ම එහි සිටි පාසල් සිසුවියන් කණ්ඩායමක් අප නෙත ගැටුණි.

මේ අපේ ශරීර තුල ටෙස්ටොස්ටොරාන් හෝමෝනය නිපදවීම සාර්ථකව ඇරඹී, ඒවා අපේ මස්තිෂ්ක සහ අනු"මස්තිෂ්ක දක්වා ගමන් කරමින් තිබූ සමයයි.




ඉඳින්, මෙකී බාලිකාවින් සමූහය අප නෙත් ඉදිරියේ ප්‍රාතිහාර්ය වීම වනාහී අපේ නෙත්, සිත් පමණක් නොව මස්තිෂ්ක පවා සසල කරවන දසුනක් විය.

දුම්රිය නැවතිණ. ඒ හරියටම මේ බාලිකාවියන් රොත්ත අප ගමන් කරමින් සිටි දුම්රිය මැදිරියේ දෙරට සමපාතවෙන ලෙසිනි.

තව තත්පරයකින් ඔවුන් දුම්රියට නැග අප ඉදිරියේ අසුන් ගැනීමට නියමිත විය.
නමුත් සිදුවූයේ මහා අභාග්‍යයකි. කෙල්ලන් පිරිස එක් වන ම දිව ගොස් අපේ මැදිරියට පිටුපසින් තිබූ දුම්රිය මැදිරියට ගොඩ නැගුනහ.

"මදෑ කොලා, ඔන්න අපිටත් වෙන දේවල්!" සමුද්‍ර ගේ මුවින් පිටවූයේ නිතැතිණි.

"මචං සමහර විට ඒ කෙල්ලෝ ටික දන්නවා ඇති උඹට පියෝ මැත්ස්වලට තිබුනේ ලකුණු විසි හයක් විතරයි කියලා. ඒකයි උන් මේ පෙට්ටියට නගින්න ඇවිල්ත් ආපහු ගියේ!" මම සරදම් බසින් කීවෙමි.
මගේ අද ඇගයුමට අනුවද එම ප්‍රකාශනය ඉතා සරල අහිංසක විහිළුවක් පමණි. මා මෙයට පෙරද සඳහන් කළ පරිදි මෙන් මේ විහිළුව කළ මගේ ලකුණු ප්‍රමාණය සමුද්‍රට ද වඩා අඩුය.

අඳුරු කරගත් මුහුණින් යුතුව සමුද්‍ර නැගිට්ටේය. මුවින් වදනක් නොදෙඩා දුම්රිය මැදිරියේ අනෙක් කෙලවරට ගොස් අසුන් ගත්තේය.

එතැන් පටන් අප එකම පාසලේ, එකම පන්තියේ සිසුවන් ලෙස ගතකළ වසර දෙකකටත් වඩා වැඩිවූ කාලය තුල ද මා හා එකදු වදනක් දෙඩුවේ සමුද්‍ර නොවේ.

අප දෙදෙනා අතර තිබූ දැඩි මිත්‍රත්වය සදහටම බිඳලීමට තරම් මා කළ ඒ සරල විහිළුව සමත් වුයේ කෙලෙසකදැයි අද ද මට නිවරදව වටහා ගත නොහැකි ය.

MATHEMATICS TUTORING

Maths Methods(CAS) 3&4

Specialist Mathematics

Maths Methods(CAS) 1&2

General Maths Advance

Mathematics Year 7-10

*by* Madira Ginnige
Experienced Current Secondary School Mathematics Teacher

Attending my small group tuition class will
- Increase confidence, Grades, motivation and self-esteem.
- Gain the ability to manage study time efficiently.
- Ability to manage time efficiently during exam periods.
- Provide opportunity to work through highly relevant, current Trial Sac & Examination questions.

To book/register, contact
03-98071577 or SMS 0432972667
or send an e-mail to:
madiraginige1@yahoo.com

*Individual lessons available on request

Venue: 1/17 Mummery Street, Mount Waverley 3149

Advertise in **Sannasa** - Please call
03 8707 4604 / 0402 025 516
email - ads.sannasa@gmail.com